# සාහිත්‍යය සමාජයෙහි නිර්මාණයක් ලෙස

ලෝරන්ස් විද්වතා විසින් කරන ලද්දේ සාහිත්‍ය නිර්මාණයක් පමණක් යැයි සිතීම වැරදි ය. අප ඔහුගේ සාහිත්‍ය කෘති වෙන් ව ගනිමින් සාකච්ඡා කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බලපෑම හේතුකොටගෙන ය. බටහිරයෝ ද ඔවුන් අනුව යන ආසියාතිකයෝ හා අප්‍රිකානුවෝ ද සාහිත්‍ය අනෙක් විෂයන්ගෙන් වෙන්කරති. වැඩිම වුවහොත් ඔවුහු ලෝරන්ස් විද්වතාගේ සාහිත්‍යයෙන් සමාජයට වූ බලපෑම හෝ එහි විලෝමය වූ ඒ මහතාගේ සාහිත්‍යයට වූ සමාජයීය බලපෑම හෝ හදාරති.

එය ඔවුන් කරන්නේ නිව්ටෝනීය යාන්ත්‍රිකයෙහි පද්ධතියක අභ්‍යන්තර බල නමින් බල විශේෂයක් සලකන ආකාරයට ය. පද්ධතියක එක් එක් අංශුවක් මත ක්‍රියාකරන බල සැලකීමේ දී ඔවුහු එක් එක් අංශුව මත පද්ධතියෙහි අනෙක් අංශූන් නිසා ඇතිවන බල බාහිර බල ලෙස සලකති. ඒ බල අභ්‍යන්තර ලෙස නම් කෙරුණ ද, ඒ නමින් පමණකි. එයට හේතුව බටහිර දැනුමට තවමත් පද්ධතිය යන්න ආගන්තුක වුවක් බැවිනි. බටහිරයෝ පද්ධතීන් ගැන නිව්ටෝනීය සුසමාදර්ශයෙහි අධ්‍යයනය කරති. ඒ සුසමාදර්ශයෙහි පද්ධතිය යන්න සමස්තයක් ලෙස නොව කොටස්වල එකතුවක් ලෙස සැලකෙයි.

බටහිරයෝ සාහිත්‍යය අනෙකුත් විෂයයන්ගෙන් වෙන් ව ගෙන හදාරති. සාහිත්‍යය හා සමාජය අතර ඇති සම්බන්ධය ඔවුන් වැඩිම වුවහොත් වටහාගන්නේ එකක් අනෙක මත ඇතිකරන බලපෑමක් ලෙස ය. එහෙත් සමාජය, විද්‍යාව, සාහිත්‍යය ආදී සියල්ල එකිනෙකට බැඳී ඇත. එහි ඇත්තේ එකක් අනෙක මත ඇතිකරන බලපෑමට වැඩි දෙයකි. මෙය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පමණක් නොව ලංකාවේ අපට ද අදාළ ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අපේ සමාජය ද ආක්‍රමණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අද අප රටේ ඉතා විශාල පිරිසක් ජීවත්වන්නේ එකිනෙක වෙන්කර ගැනීමෙන් ය.

අපට බොහෝවිට අසන්නට ලැබෙන කරුණක් නම් අද පැල්කවියක්, ජනකවියක් කියන්නකු නැති බව ය. අද ජනගායනා ඇසෙන්නේ ඒ ඒ පුද්ගලයන් ඒ ඒ කාර්යයන් කරන අවස්ථාවල නොව රූපවාහිනියෙහි, ගුවන් විදුලියෙහි හා ප්‍රසංගවල ය. පැල් කවි පතල් කවි ගායනා වූ පැල්වල, පතල්වල අද අවශ්‍ය නම් ගුවන් විදුලියෙන් ඒ ඒ ගායනා අසාගත හැකි ය. එසේත් නැත්නම් බොහෝ විට කෙරෙන පරිදි ඒ ඒ තැන්වල දී වෙනත් ගීත, බයිලා ආදිය ගුවන් විදුලියෙන් ශ්‍රවණය කළ හැකි ය. ඇතැමුන්ට ඒ අපට වැළැක්විය නො හැකි නවීකරණයකි. තවත් ඇතැමුන්ට අනුව අප නවීකරණය සඳහා තව තවත් අවස්ථා ඇති කරලිය යුතු ය.

එහෙත් ඉතා පැහැදිලිව බොහෝ දෙනකුට අපේ සංස්කෘතික ලක්ෂණ අප පවත්වාගෙන යා යුතු ය. සිංහල අවුරුද්ද නමින් අද හැඳින්වෙන (ඇතැමුන්ට අනුව ඒ සිංහල දෙමළ හෝ සිංහල හින්දු අළුත් අවුරුද්ද ) අළුත් අවුරුද්ද මේ සංස්කෘතික අවශ්‍යතාවට හොඳම උදාහරණය වෙයි. මුළු කොළඹ වසා දමා ඒ දිනවල සිංහලයෝ තම ගම් බිම් බලා යති. එහෙත් අපට ඒ සංස්කෘතික අවශ්‍යතාවට ඉඩදිය හැක්කේ දින කිහිපයකි. නැවතත් කොළඹ එන අපි බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත් වෙමු.

එසේ ජීවත්වන අතර ඉඳහිට ගුවන් විදුලියෙහි හෝ රූපවාහිනියෙහි හෝ ජනගායනයකට සවන් දෙමු. එසේත් නැතහොත් ජනගායනා ප්‍රසංගයකට ගොස් පැයක් දෙකක් ජනගායනා අසමු. අප මේ සියල්ලෙන් කරන්නේ අපේ සංස්කෘතික අවශ්‍යතා යම් ප්‍රමාණයකට හෝ සපුරාලීම ය. එහෙත් ජීවිතයෙන් ඉතා වැඩි කාලයක් අප ගෙවන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අධ්‍යාපනයක් ලබා ඒ නූතනත්වයෙහි කරවටක් ගිලී හිඳීම ය. දැන් දැන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අපේ සංස්කෘතිය වීමේ අනතුරට ද අපි මුහුණ පා සිටිමු.

ඒ අනතුරක් වන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය වෙනුවට බටහිර යුදෙව් ක්‍රිස්තියානි නූතනත්වය ආදේශවීමේ ඉඩකඩ බෙහෙවින් වීම නිසා ය. මේ සංස්කෘතික යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් වෙයි. අප රටෙහි පමණක් නොව අනෙක් රටවල ද මේ සංස්කෘතික යටත්විජිතවාදය ක්‍රියාත්මක වෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ මුළු ලෝකයට ම අවසානයේ දී

© Prof. Nalin De Silva

එක් සංස්කෘතියක්, එනම් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පමණක් වීම ය. ඉන් මුළු ලෝකයට ම වන හානිය ඉතා බරපතළ ය. ඒ ගැන බොහෝ දෙනකුට තවමත් හැඟීමක් නොමැතිවීම කණගාටුදායක ය.

අප මේ පිළිබඳ ව ජනතාවගේ අවධානය යොමු කෙළේ මාර්ටින් වික්‍රමසිංහ ශත සංවත්සර උත්සවයෙහි දී ය. ලෝකයට ම එකම සංස්කෘතියක් පමණක් වීමෙන් ඒ සංස්කෘතියෙහි විසඳාගැනීමට නොහැකි ප්‍රශ්නයක් ඇතිවුවහොත් මුළු ලෝකයෙහි ම, එනම් මනුෂ්‍ය සංහතියෙහි ම, පැවැත්මෙහි ම අර්බුදයක් ඇතිවන බව අපි එදා පෙන්වාදුන්නෙමු. ජීව ලෝකයෙහි ජීවීන්ගේ පැවැත්මට ජීව විවිධත්වය අවශ්‍ය වන්නාසේ ම මිනිස් ලෝකයෙහි පැවැත්මට ම සංස්කෘතික විවිධත්වය අවශ්‍ය වෙයි. එහෙත් මුළු ලෝකයට ම ඒක සංස්කෘතියක් ඇති වූ විට සංස්කෘතික විවිධත්වයක් නැති නිසා ම මිනිස් පැවැත්මෙහි ම අර්බුදයක් ඇතිවෙයි.

අද රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකාවල  අපේකම, අපේගම පිළිබඳ වැඩසටහන් ප්‍රචාරය වෙයි. ඒ එක් පැත්තකින් යහපත් වෙයි. අඩුම තරමින් ඊළඟ පරම්පරාවේ කිහිප දෙනකුට හෝ සංස්කෘතික විවිධත්වය ගැන පණිවුඩයක් දීමට ඒ වැඩසටහන්වලට හැකියාවක් ඇත. එහෙත් ඒ වැඩසටහන්වලින් අවසානයේ දී කෙරෙන්නේ කුමක් ද? ඉන් කියා දෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ගොදුරුවන අතර අපේකම ද, එනම් අපේ සංස්කෘතිය ද රැකගැනීමට සුළු උත්සාහයක් දැරිය හැකි බව ය. පරණ තෙස්තමේන්තුවේ යුදෙව්වන්ගේ අවශ්‍යතාව වූයේ මුළු ලෝකයෙහි ම තම සංස්කෘතිය ප්‍රචලිත කිරීම ය. අපේකම, අපේගම තේමාව කරගත් වැඩසටහන්වලින් ද ඒ ප්‍රචලිත වෙයි.

එහෙත් සංස්කෘතික යටත්විජිතවාදය, සංස්කෘතික විවිධත්වය, සංස්කෘතික යටත්විජිතවාදය හා ඒ සමග වූ අවුරුදු පන්සියයක් පමණ කාලයක් තිස්සේ කෙරීගෙන යන දේශපාලන, ආර්ථික හා සංස්කෘතික යටත්විජිතවාදය  ආදී ප්‍රශ්න ගැන ඒ වැඩසටහන්වල කිසිදු සාකච්ඡාවක් නො සිදුවෙයි. ඒ වෙනුවට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි වෙන්කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස (මේ වෙන්කිරීම ගැන මෙලෝ හසරක දැනුමක් ඒ වැඩසටහන් නිෂ්පාදකයන්ට ඇතැයි මෙයින් නො කියැවෙයි.) යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වන අතර අපේකමින් දශමයක් සංකේතයක් ලෙස වෙනම පවත්වාගෙන යන ආකාරය ඉන් කියා දෙයි. ඒ අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට තල්ලුකිරීමක් මිස වෙනත් දෙයක් නො වෙයි.

මේ වැඩසටහන්වලට සහභාගිවන විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් ද ඇතුළු බොහෝ උගතුනට අවශ්‍ය ගම්වලට බටහිර දැනුම හඳුන්වාදීම ය. ඔවුහු ඈංකරයෝ හා ඈංකරයෝ ම පමණක් වෙති. අවශ්‍ය නම් බටහිර නිපදවෙන දැනුම අවශෝෂණය කරන්නේ කෙසේ දැයි ඔවුහු නො දනිති. අපේ ගම, ඊනියා නිර්මල සිංහල සංස්කෘතිය ගැන ලියූ මාර්ටින් වික්‍රමසිංහ මහතාට පවා ඒ ගැන අවබෝධයක් නොවූ කල මේ උගතුනට ඒ පිළිබඳ දැනුමක් තිබිය හැක්කේ කෙසේ දැයි ඇතැමකුට ප්‍රශ්නයක් විය හැකි ය. එහෙත් මාර්ටින් වික්‍රමසිංහ මහතා මියගොස් දැනට අවුරුදු තිහක් පමණ කාලයක් වන අතර මේ ප්‍රශ්න මෙරට සාකච්ඡාකිරීමට පටන්ගෙන අවුරුදු විස්සකට වැඩි කාලයක් ගෙවී ඇත. මේ උගතුන් ඒ සාකච්ඡාව ලිං මැඩියන්ගේ සාකච්ඡාවක් ලෙස සිතාගෙන සිටින බව පෙනෙයි.

ගමට මධ්‍ය මහා විද්‍යාල ගෙන යෑමේ දෙවැනි පියවර මේ ඊනියා නව දැනුම ගමට ගෙන යෑමේ ව්‍යාපෘතියෙන් සිදුවෙයි. ගමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පාසල් ඔස්සේ ගෙන යෑමේ ප්‍රතිඵලය වූයේ අවසානයේ දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තුළ ඉහළට නැගී කිහිප දෙනකු බිහිවීමත් බොහෝ දෙනකු අක් මුල් නැති ගන්ධබ්බයන් පිරිසක් බවට පත්වීමත් ය. එතෙක් නගරයෙන් පමණක් බිහි වූ අනුකාරක උගතුන් අනුකාරකත්වයෙන් පරදවන්නෝ ඉන්පසු ගමෙන් බිහිවූහ. අද ඊනියා නව දැනුම ගෙන යෑමට බලාපොරොත්තු වන්නේ පන්සල ඔස්සේ ය. මෙයින් සිදුවන්නේ පන්සලට ද කණකොකා හැඬීම ය. මේ ව්‍යාපෘතිවලට රාජ්‍යය හා රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ බටහිර රටවල (ජපානය ද බටහිර රටක් ලෙස සැලකෙයි. එහි කාන්තාවෝ ඉඳහිට කිමෝනාව ඇඳීමෙන් තම සංස්කෘතික අවශ්‍යතා ඉටුකර ගැනීමට බලාපොරොත්තු වෙති.) ආධාර ලැබෙන්නේ අප කෙරෙහි පතළ වූ කරුණාව නිසා නම් නො වෙයි.

මෙයින් අදහස් කරන්නේ බටහිර දැනුම නගරයට සීමා කළයුතු ය යන්න නො වෙයි. නගරයට වුව ද බටහිර දැනුම ඒ අයුරින් ම අනවශ්‍ය ය. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සංස්කෘතික ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාදයෙහි අප පෙළන ප්‍රධාන ම අංගය වූ දැනුම ඒ අයුරින් ම අනුකරණය කිරීමට උපදෙස් දෙන ඊනියා

© Prof. Nalin De Silva

උගත්තු මෙරටට විනාශය ගෙන දෙති. අපට අවශ්‍යවන්නේ බටහිර දැනුම අනුකරණය කිරීම නොව ඒ අපට අවශ්‍ය ආකාරයට අවශෝෂණය කිරීම බව නැවත නැවතත් මතක් කරමු.

සාහිත්‍යය දේශපාලනයෙන්, සාරධර්මවලින්, සමාජ විශ්ලේෂණයෙන් ආදියෙන් වෙන්කරගෙන හදාරන්නේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ය. සාහිත්‍යය අනෙක් සියල්ල සමගින් සමස්තයක් ලෙස එකට හැදෑරීමක් පැරණි සිංහලයන් අතර විය. අප නැවතත් මතුකර ගත යුත්තේ මේ හැදෑරීම ය. මෙහි දී කිවයුතු කරුණක් වෙයි. බටහිරයන් කෙතෙක් උත්සාහ කළත් ඔවුන්ට ද මේ එකට ගැනීමෙන් වෙන්විය නො හැකි ය. එහෙත් ඒ එකට ගැනීම “යථාර්ථයක්” හෝ “වාස්තවිකත්වයක්” හෝ නොවන බව අවධාරණය කළයුතු ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි වෙන්කිරීමක් වෙයි. ඒ බටහිරයන්ට අවශ්‍ය අන්දමට ය. ඒ ඔවුන්ට සමාජය පෙනෙන හා පෙනිය යුතු ආකාරයට අනුව ය. එහෙත් අපට සාපේක්ෂව ගත්කල ඒ එසේ නො සිදුවෙයි. බටහිරයන්ට සාපේක්ෂව සිදුවන වෙන්කිරීම ම ඔවුන්ගේ ඒ ඒ වෙන්කිරීම් බැඳ තබන හුයක් වෙයි. කිසිම රාජ්‍යයක් ආගමික හෝ ආගමික නොවන හෝ සංස්කෘතියකින් වෙන් නො වෙයි. බටහිර රාජ්‍යය කොතෙක් ආගමෙන් වෙන්කිරීමක් ගැන කැ ගැසුව ද ඒ රාජ්‍යය සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වෙයි. ලෝරන්ස් විද්වතාගේ සාහිත්‍යය ද එසේ ය. එයට වූ ඊනියා සමාජයීය බලපෑම හෝ සමාජයට ඒ සාහිත්‍යයෙන් වූ බලපෑම හෝ වෙනුවට අප සාකච්ඡා කළයුත්තේ ලොරෙන්සීය සාහිත්‍යය එකල තිබූ සමාජයෙන් කෙසේ බිහිවූයේ ද යන්න ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva